පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ප්‍රකාරව, ක්ෂය අඩුකල අගය ශුන්‍ය වී ඇති වත්කම් නැවත ප්‍රයෝජනයට ගන්නේ නම් එම වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළයුතු වුවද, එකතුව රු.1,678,403,597 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 07 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් කටයුතු නිමකර ප්‍රයෝජනයට ගනිමින් පවත්නා රු. 67,460,656 ක් වටිනා ගොඩනැගිලි ප්‍රාග්ධනිත කර නොතිබූ අතර, ඒ වෙනුවෙන් රු. 3,140,566 ක ක්ෂය ප්‍රතිපාදනද සිදුකර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය යන ආයතන ඒකාබද්ධ කොට පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන කාරක ප්‍රාග්ධනයේ විචලනය සඳහා යොදා තිබුණු අයිතම 05 ක් නිවැරදිව දක්වා නොතිබීම නිසා රු. 85,700,753 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) පාඨමාලා කාලය සැලකිල්ලට ගැනීමේදී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණු රු. 24,169,477 ක ආදායම්, සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිව තිබූ රු.2,383,265 ක රසායන හා ලිපිද්‍රව්‍ය තොග මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොග ලෙස ඇතුළත් නොකර, අදාල වර්ෂවලදී වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) කෘෂිවිද්‍යා පීඨයේ කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානයට අයත් රු. 1,318,127 ක ඉතිරි කිරීම් බැංකු ගිණුම් ශේෂයන්ගේ සහ ඉංජිනේරු සැලසුම් මධ්‍යස්ථානයේ රු. 813,591 ක බැංකු ස්ථාවර තැන්පතුවේ එකතුව වූ රු. 2,131,718 ක බැංකු ශේෂ මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැර තිබුණි.

(ඊ) දන්ත වෛද්‍ය පීඨය සඳහා පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වටිනාකම ගණනය නොකරන ලද අයිතම 20 කට අයත් භාණ්ඩ ඒකක 468 ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(උ) විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක 21 වන ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.5,057,352 ක් හා පුස්තකාල සහ වෙනත් වියදම් සඳහා වැයකර තිබූ රු.15,930,379 ක් විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශන මඟින් නිරූපනය කර නොතිබුණි.

(ඌ) වෛද්‍ය පීඨය සඳහා සායනික රසායනාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිණිස එළැඹි අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඒ සඳහා වූ වියදම, ලැබෙන අරමුදල් මඟින් පියවිය යුතු වුවත්, විදේශීය ශිෂ්‍යයන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු.26,313,723 ක මුදල් උක්ත අරමුදලට බැර නොකර, වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) විශ්වවිද්‍යාලය සතු අනේවාසික විදේශ ව්‍යවහාර ඉතිරි කිරීම් ගිණුම් 05 ක සමාලෝචිත වර්ෂය අවසානයට වූ හුවමාරු අගය පරිවර්තනය කර නොතිබීම හේතුවෙන් විදේශ විනිමය හුවමාරුමත වූ රු.1,196,833 ක ලාභය ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) විගණනය සඳහා ලැබී ඇති තොරතුරු අනුව ගිවිසුම් කඩකල ආචාර්යවරුන් හා නිලධාරීන් 122 දෙනෙකුගෙන් අය නොවන රු.153,137,696 ක ශේෂයක් ලැබිය යුතු ලෙස සලකා ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල විදේශගත වූ ආචාර්යවරුන් හා නිලධාරීන්ගෙන් ලැබිය යුතු ශේෂය සහ අරමුදල් ශේෂය රු. 153,137,696 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) ගහවට කෝරලේ ප්‍රාදේශීය සභාව වෙත බදු දී තිබූ විශ්වවිද්‍යාලය සතු ඉඩමක් වෙනුවෙන් 1997 සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු රු. 5,999,000 ක බදු මුදල් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

### 1.2.3 නොසැසඳු පාලන ගිණුම්

විෂයයන් 04 කට අදාල එකතුව රු.30,863,092 ක් වූ ගිණුම් ශේෂ ඊට අදාල පාලන ගිණුම්වල එකතුව වූ රු. 44,646,476 ක ශේෂය සමඟ සැසඳීමේදී රු.13,783,384 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

**1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට 2011 සහ 2012 වර්ෂවලට අදාලව විශ්වවිද්‍යාල සිසුන්ගෙන් ලැබිය යුතු දඩ හා ශාලා ගාස්තුවල එකතුව රු.4,054,215 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණු වර්ෂ 01 - 07 දක්වා කාලයක සිට පැවත එන එකතුව රු. 2,677,038 ක ණය ශේෂ 04 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) තොග ගැලපුම් ගිණුමේ ඉකුත් වර්ෂයේ සිට පැවත එන රු. 13,168,099 ක ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රු. 460,500 ක් වටිනා ලැබිය යුතු ශේෂ 13 ක්, රු. 230,000 ක අග්‍රිම අත්තිකාරම් ශේෂයක්, රු. 173,382 ක හඳුනා නොගත් වැටුප් අත්තිකාරම් ශේෂයක්, රු.318,892 ක වෙනත් ලැබිය යුතු ශේෂ, රු.2,159,500 ක ණය ශේෂ සහ රු. 10,544 ක උත්සව අත්තිකාරම් ශේෂ ඇතුළුව එකතුව රු. 3,352,818 ක් වූ ශේෂ වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසානයේදී ද අයකරගත යුතුව පැවතුණි.

**1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු. 9,014,004,656 ක් වූ පහත සඳහන් ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකි විය.

| විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| (අ) දේපළ, පිරියත හා උපකරණ | 8,911,604,939 | මෙම වත්කම්වල පැවැත්ම හෝ වටිනාකම තහවුරු කර ගැනිම සඳහා අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛණ, සමීක්ෂණ මණ්ඩල වාර්තා හෝ වෙනත් පිළිගත හැකි සාක්ෂි. |
| (ආ) ගිවිසුම් කඩකළ ආචාර්යවරු 21 දෙනෙකුගේ ඇපබැඳුම්කර | 6,866,905 | ඇපබැඳුම්කර සහ ආචාර්යවරුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් අංක සහිත තොරතුරු |

| | | |
|---|---|---|
| (ඇ) පීඨ 08 ක කථිකාචාර්යවරු 64 දෙනෙකුගේ පර්යේෂණ දීමනා | 8,423,276 | පර්යේෂණ වාර්තා, සඟරා ජ'නල්, සහ පර්යේෂණ සැසි පිළිබඳ තොරතුරු |
| (ඈ) ශාස්ත්‍ර පීඨයේ තොග | 4,246,133 | යාවත්කාලීන කරන ලද තොග පොත් සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ඉ) බාහිර විභාග අංශයේ ආධාර මඟින් ලද වත්කම් | 1,468,164 | උපලේඛන හෝ වෙනත් ලිඛිත සාක්ෂි. |
| (ඊ) නිරවුල් නොකළ ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ | 5,298,577 | - එම - |
| (උ) ගෙවිය යුතු ඇප තැන්පත් | 4,709,600 | තැන්පත් ලේඛනය හෝ බිල්පත්. |
| (ඌ) බැංකු ගිණුමක 2010 ජනවාරි 01 දින සිට 2013 මැයි 30 දින දක්වා ඉවත් කරන ලද මුදල් | 1,596,783 | මුදල් පොත් සහ ගෙවීම් වවුචර් |
| (එ) මූලධන වියදම් | 4,487,513 | ගෙවීම් වවුචර් |
| (ඒ) විවිධ ණයහිමියෝ | 65,302,766 | විස්තරාත්මක උපලේඛන සහ ශේෂ තහවුරු කිරීම් |
| | 9,014,004,656 | |

**1.3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| 45 වගන්තිය | බාහිර පාර්ශව සමඟ උපකුලපතිවරයා විසින් ගිවිසුම්වලට එළැඹිය යුතු වුවද, සම සෞඛ්‍ය වෛද්‍ය පීඨයට අයත් රු. 375,000 ක වටිනාකමකින් යුතු පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය පරිදි ගිවිසුම්ගත වීමකින් සහ පර්යේෂණ සභාවේ අනුමැතියකින් තොරව සිදු කර තිබුණි. |

(ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය

| | |
|---|---|
| (I) VIII පරිච්ඡේදයේ 6.1(අ) වගන්තිය | විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන කථිකාචාර්යවරුන් දෙදෙනෙකු පෞද්ගලික උපදේශකයින් ලෙස බඳවා ගෙන රු.480,000 ක උපදේශන දීමනා ගෙවා තිබුණි. |
| (II) IX පරිච්ඡේදයේ 3.4, 3.5 හා 3.6 වගන්ති | සේවා නියුක්තිකයෙකු විසින් උපයාගනු ලබන අතිකාල දීමනා ඔහුගේ මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට 35 නොඉක්මවිය යුතු වුවද, එම සීමාව ඉක්මවා සනාථන සභාවට අයත් අංශ 03 ක සේවා නියුක්තිකයින් වෙනුවෙන් එකතුව රු.23,642,560 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (III) XX පරිඡේදයේ 3 වගන්තිය | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැමිණීමේ සහ පිටවීමේ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, කාර්ය මණ්ඩලයේ නියුතු 746 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු. 998,352,538 ක මුදලක් ගෙවා තිබුණි |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | |
|---|---|
| (I) මුදල් රෙගුලාසි 110 | කෘෂිකර්ම විද්‍යා පීඨයේ සහ විද්‍යා පීඨයේ හානි පාඩු සටහන් කිරීම සඳහා හානි ලේඛන පවත්වා නොතිබුණි. |
| (II) මුදල් රෙගුලාසි 188 | බැංකු ගිණුම් 03 කට අදාල 2003 සිට 2012 දක්වා කාලයට අදාල එකතුව රු. 489,625 ක නිෂ්කාශණය නොවූ තැන්පතු 45 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (III) මුදල් රෙගුලාසි 212(2) v | වැටුපෙන් අය නොකළ, වර්ෂ 03 ට වඩා පැරණි වැටුප් අත්තිකාරම් ශේෂවල එකතුව රු.177,651 ක් වී තිබුණි. |
| (IV) මුදල් රෙගුලාසි 237 (ආ) | ඉංජිනේරු පීඨයට අයත් රු. 554,520 ක මිලදී ගැනීම් තොග ලේඛනවල සටහන් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (V) මුදල් රෙගුලාසි 371 | * | විශ්වවිද්‍යාලය විසින් රු. 20,000 ක සීමාව ඉක්මවා අවස්ථා 57 කදී රු. 2,418,788 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. |
| | * | පශු වෛද්‍ය පීඨය විසින් රු.354,241 ක අග්‍රිම බාහිර ආයතන 06 කට සහ මාණ්ඩලික නොවන නිලධාරියෙකුට ලබා දී තිබුණි. |
| | * | සම සෞඛ්‍ය විද්‍යා පීඨය විසින් අවස්ථා 03 කදී නිකුත් කර තිබුණු එකතුව රු. 65,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම කිසිදු ප්‍රයෝජනයට නොගෙන ආපසු මුදලින් පියවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂ වලදී ලබා දී තිබු එකතුව රු.37,343,154 ක් වු සැපයීම් හා විවිධ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් පියවා නොතිබුණි. |
| (VI) මුදල් රෙගුලාසි 570(ඇ) හා 571 | | තැන්පත් කළ දින සිට වර්ෂ දෙකක් ඉක්මවා තිබුණු එකතුව රු. 3,621,630 ක් වු විවිධ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 1990 පෙබරවාරි 06 දිනැති අංක 422 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | | කෘෂි විද්‍යා පීඨයේ කථිකාචාර්යවරුන් 24 දෙනෙකු හට පාලක සභා අනුමැතියකින් තොරව, රු.793,500 ක ගෞරවාන්විත දීමනා හා වෙනත් දීමනා ගෙවා තිබුණි. |
| (ඉ) 1994 ජුනි 14 දිනැති අංක 95(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයට අයත් නිලධාරීන් 04 දෙනෙකු සඳහා 2012 වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් මාසික වැටුපෙන් සියයට 25 බැගින් රු.327,998 ක අධ්‍යක්ෂ මණ්ඩල දීමනා සහ දන්ත වෛද්‍ය පීඨයේ වෛද්‍යවරුන් හා අනෙකුත් නිලධාරීන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 448,300 ක දීමනා භාණ්ඩාගාර හෝ අමාත්‍යාංශ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ විවිධ දෙපාර්තමේන්තු විසින් බාහිර ආයතන හා පුද්ගලයින් වෙත සපයන ලද රසායනාගාර පරීක්ෂණ සේවා වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී අයකර තිබූ රු. 6,137,738 ක ගාස්තුවලින් චක්‍රලේඛයට පටහැනිව රු.3,521,704 ක් කාර්ය මණ්ඩල දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (උ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | නිලධාරියෙකුට හිමි උපරිම ආපදා ණය සීමාව රු.250,000 ක් හෝ නිලධාරියාගේ මාස 10 ක ඒකාබද්ධ වැටුප යන දෙකෙන් අඩු වටිනාකම වුවත්, අවස්ථා 08 කදී එම සීමාව ඉක්මවා එකතුව රු.818,645 ක ආපදා ණය ගෙවා තිබුණි. |

## 1.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉංජිනේරු පීඨයේ පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා ජාතික විද්‍යා පදනම විසින් රු.432,000 ක අරමුදල් ලබා දී තිබූ අතර, ව්‍යාපෘති කාලය 2004 අප්‍රේල් 28 දිනෙන් අවසන් වී තිබුණි. ඉන් අනතුරුව මෙම ව්‍යාපෘතිය 2005 දෙසැම්බර් 31 දින විධිමත් අනුමැතියකින් තොරව යළි ආරම්භ කොට 2012 සැප්තැම්බර් 03 දින දක්වා ක්‍රියාත්මක කර රු. 399,292 ක වියදම් ද දරා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලකගේ ලිපිය පරිදි දන්ත වෛද්‍ය පීඨයේ මුඛ සහ හනු ශල්‍යකර්ම ව්‍යාපෘතියේ උපකරණ ආනයනය කිරීම සඳහා පමණක් විදේශ විනිමය ගිණුමෙන් මුදල් ඉවත් කළ හැකි වුවත්, ඊට පටහැනිව එම ගිණුමෙන් රුපියල් මිලියන 10 ක් ආයෝජනය කර රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක් විවෘත කර තිබුණි.

(ඇ) 2012 වර්ෂය තුළ අයවිය යුතු රු.5,125,335ක සේවක ණය වාරික සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඌනතාවය රු. 405,269,886 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.348,897,221 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදි ඌනතාවය රු.56,372,665 කින් වැඩි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් හා නිලධාරීන් 70 දෙනෙකුගේ ඇප බැඳුම්කර අනුව වටිනාකම වූ රු.23,292,536 ක මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අතිකාල හා නිවාඩු දින සේවයේ යෙදෙන නිලධාරීන් අදාල වැඩ කරන දිනට පෙර හෝ පසුදින සේවයට පැමිණිය යුතු වුවත්, අවස්ථා 12 කදී ඉහත නියමයට පටහැනිව එකතුව රු.766,321 ක අතිකාල දීමනා ගෙවා තිබුණි.

(ඇ) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයෙහි සමාලෝචිත වර්ෂයේ දී කෙටිකාලීන පාඨමාලා පවත්වා නොතිබු නමුත්, එම පාඨමාලා වලට අදාලව රු. 10,741,305 ක්වූ මුදලක් ආයතන හා පරිපාලන වියදම් ලෙස දරා තිබුණි.

(ඈ) පරිත්‍යාග මුදල් ආයෝජනය කර ලැබෙන පොලියෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.10,624,012 ක් වටිනා ශිෂ්‍යත්ව පිරිනැමිය යුතු වුවත්, රු. 2,941,918 ක් වටිනා ශිෂ්‍යත්ව පමණක් පිරිනමා තිබුණි. එය පිරිනැමිය යුතු මුළු ශිෂ්‍යත්ව ප්‍රමාණයෙන් සියයට 28 කි.

(ඉ) විශ්වවිද්‍යාලය යටතේ ඇති ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථාන ව්‍යාපෘතියට අදාළ යෝජනාවලියට අනුව, ස්ථාවර වත්කම් මිලදී ගත නොහැකි වුවද, සමාලෝචිත වර්ෂය තුළ රු. 1,569,840 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහපොල හා ශිෂ්‍යාධාර මුදල් අදාල වර්ෂය තුළ නොගෙවීම හා උපාධිධාරි ගුරුවරුන්ගෙන් අවකරණය කළ මුදල් අදාළ අරමුදල් වෙත නොයැවීම හේතුවෙන් එම ගිණුම්වල සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළිවෙලින් රු.5,544,463 ක සහ රු.16,003,695 ක ශේෂ ඉතිරිව පැවතුණි.

(ආ) ශාස්ත්‍ර පීඨය මගින් පවත්වා අවසන් කර තිබූ සිංහල, ඉංග්‍රිසි, දෙමළ භාෂා පරිවර්තන පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලා අරමුදලේ රු.1,058,670 ක ශේෂයක් පාඨමාලා කටයුතු වෙනුවෙන් උපයෝජනය කිරීමෙන් තොරව, වසරක කාලයක් නිශ්කාර්යව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ හා දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට තොග සමීක්ෂණ වාර්තා අනුව රු. 994,559 ක් වටිනා අතිරික්ත තොග, භාවිතයට නොගන්නා තොග, කල් ඉකුත් වූ තොග, සෙමෙන් චලනය වන තොග, හානි වූ තොග ආදිය අනාවරණය කර තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කිසියම් සේවකයෙකුගෙන් රජයට අයවිය යුතු මුදලක් වේ නම්, එම මුදල ඔහුගේ විශ්‍රාම පාරිතෝෂික මුදලින් අයකර ගත යුතු වුවද, හිටපු සහකාර ලේඛකාධිකාරීවරයෙකුගෙන් අයවිය යුතු රු.230,000 ක අත්තිකාරම් මුදල අයකර ගැනීමෙන් තොරව 2012 මාර්තු 22 දින රු. 900,700 ක්වූ පාරිතෝෂික මුදල නිදහස් කර තිබුණි.

(ආ) ව්‍යුහ ඉංජිනේරු නිර්මාණ දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානි ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයේ උපදේශන සේවා සැපයීම සම්බන්ධව අසාදු ලේඛණ ගතකර තිබියදී ඉන් පසුවද ඔහු ට උපදේශන සේවා සැපයීම් පවරා 2011 සහ 2012 වර්ෂවලදී සේවා සැපයීම වෙනුවෙන් රු. 356,500 ක උපදේශන ගාස්තු ගෙවා තිබුණි.

(ඇ) උපදේශක සේවා සැපයීම මඟින් ආයතනයට ලැබෙන ආදායමින් සියයට 60 ක් භාණ්ඩාගාරයේ එම කටයුතු වෙනුවෙන් නඩත්තු කරනු ලබන අරමුදල් ගිණුමට මාස තුනකට වරක් බැර කළයුතු වුවත්, 2007 සිට 2012 වර්ෂය දක්වා ලැබී තිබූ රු.110,264,884 ක උපදේශක ගාස්තු වෙනුවෙන් රු.66,158,930 ක මුදලක් භාණ්ඩාගාරයේ අදාළ ගිණුමට බැර නොකර ඉංජිනේරු නිර්මාණ කේන්ද්‍රීය ගිණුමට බැර කර තිබුණි.

(ඇ) පර්යේෂණ කටයුතු සඳහා ලැබෙන අරමුදල් අදාළ පර්යේෂණ කටයුතු සඳහා පමණක් යෙදිය යුතු වුවද, 2012 වර්ෂයේදී ලැබී තිබූ රු. 39,000,000 ක පර්යේෂණ ප්‍රදාන උපයෝගි කරගෙන විධිමත් අනුමැතියකින් තොරව රු. 8,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(ඉ) කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේ පටිපාටියට අනුව එකී තනතුරුවලට බඳවාගත් දින සිට වසර 08 ක් තුළ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා ගතයුතු වුවද, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ කථිකාචාර්යවරියක විසින් 2001 අප්‍රේල් 09 දින සිට 2009 වර්ෂය දක්වාම එම සුදුසුකම් සපුරා නොතිබියදී ඇයගේ සේවය අවසන් නොකොට 2010 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II තනතුරට උසස් කර එදින සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා වැටුප් හා දීමනා ලෙස රු.5,249,271 ක මුදලක් ගෙවා තිබුණි.

(ඊ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ බෝග විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්යවරයෙකු 2004 මාර්තු 01 දින සිට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපාධි අපේක්ෂක අධ්‍යනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සේවය කිරීම පිණිස මුදා හැර තිබුණි. එසේ මුදාහරිනු ලබන කාලපරිච්ඡේදය වර්ෂ 02 කට නොවැඩි විය යුතු අතර, එම කාලය අවසානයේ පෙරලා තම නිත්‍ය තනතුරට පැමිණිය යුතු වුවද, මහාචාර්යවරයා ඒ අනුව කටයුතු නොකර, වර්ෂ 3 1/2 ක පමණ කාල සීමාවක් විධිමත් අනුමැතියකින් තොරව එම ව්‍යාපෘතියේ සේවය කර තිබුණි.

(උ) කෘෂිකර්ම විද්‍යා පීඨයේ අන්තර්ජාතික පරමාණු බලශක්ති අධිකාරිය නමැති ව්‍යාපෘතිය සඳහා විශ්වවිද්‍යාල පර්යේෂණ කමිටුවේ සහ මූල්‍ය කමිටුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ව්‍යාපෘතියට රු.5,197,578 ක අරමුදල් ලැබී තිබුණු අතර, ඒ වෙනුවෙන් එක් එක් කාලපරිච්ඡේදවලට අදාල මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබුණි. තවද, ව්‍යාපෘතිය යටතේ අනුමැතියක් නොමැතිව විදේශ ගමන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 108,800 ක මුදලක් වැයකර තිබුණි.

(ඌ) විශ්වවිද්‍යාල සේවයේ නියුතු නිලධාරීන්හට දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනා සඳහා හිමිකම් නොමැති වුවද, එයට පටහැනිව 1994 සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ඔවුන් හට රු. 39,716,603 ක දීමනා ගෙවා තිබුණි.

**3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය සතුව අනේවාසික ගිණුම් 05 ක් පැවති අතර, එහි ශේෂ එකතුව රු.10,890,526 ක් වු නමුත් 2003 සිට 2012 වර්ෂය දක්වා එම ගිණුම් මගින් කිසිදු ගනුදෙනුවක් සිදු වී නොතිබුණි.

(ආ) පර්යේෂණ නැංවීම් හා උපකරණ නඩත්තු අරමුදල් ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.765,846 ක ශේෂයක් සහ එකතුව රු. 39,610,428 ක පැරණි පර්යේෂණ හා අරමුදල් ශේෂ 167 ක් පැවති අතර එම ගිණුම් ශේෂ සමාලෝචිත වර්ෂය තුළ කිසිදු පර්යේෂණ කටයුත්තක් සඳහා උපයෝගි කර ගෙන නොතිබුණි.

(ඇ) අධ්‍යයන නිවාඩු මත විදේශගත වු ආචාර්යවරුන් විසින් විශ්වවිද්‍යාලය වෙත එවන ලද රු. 129,837,205 ක ඇපබැඳුම්කර මුදල්, අදාල චක්‍රලේඛයේ සඳහන් අරමුණු සඳහා යොදා නොගෙන අරමුදල් ගිණුම් 10 ක රඳවාගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම යටතේ, කෘෂිකර්ම පීඨයට 2012 - 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ පර්යේෂණ 06 ක් සිදු කිරීම පිණිස රු.මිලියන 2.61 ක් ලැබී තිබු අතර, ඉන් රු.මිලියන 1.3 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ආපසු යවා තිබුණි. එසේම 2009 සිට 2011 වර්ෂය දක්වා කාලසීමාව තුළ පර්යේෂණ සිදුකිරීම පිණිස ලැබී තිබු රු.මිලියන 1 ක මුදලක්ද කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ඉ) සම සෞඛ්‍ය විද්‍යා පීඨයට අයත් රු. 1,408,712 ක් වටිනා රසායනික ද්‍රව්‍ය නිෂ්ක්‍රීයව පැවතුණු අතර, රු. 510,120 ක් වටිනා රසායනික ද්‍රව්‍ය අයිතම 48 ක් සෙමින් නිකුත් වෙමින් පැවතුණි.

(ඊ) සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ රසායනාගාර දෙපාර්තමේන්තුවට අයත් රසායනාගාර ඒකකය සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන මඟින් මිලදී ගනු ලැබු රු. 938,364 ක් වටිනා Auto Clave 150 L නමැති උපකරණයක් 2014 නොවැම්බර් මස වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(උ) විද්‍යා පීඨයේ විද්‍යා අධ්‍යාපන ඒකකය මඟින් මුද්‍රණය කරන ලද රු. 1,534,255 ක් වටිනා පොත්පත් 6957 ක් ගබඩාවේ රඳවා තිබුණි.

(ඌ) දන්ත වෛද්‍ය පීඨය යටතේ ඇති දෙපාර්තමේන්තු 04 ක් විසින් දන්ත සේවා සැපයීමට අදාලව රෝගීන්ගෙන් 2003 මාර්තු 15 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා අය කරන ලද රු. 2,259,121 ක මුදලක් නිශ්චිත කාර්යයක් සඳහා යොදා ගැනීමෙන් තොරව, පීඨයට අයත් බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.

(එ) රජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක ආයෝජනය කර තිබු සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.1,734,858 ක්වු ශාස්ත්‍ර පීඨයට අයත් මුදල ඵලදායි ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) පිරිවිතර නිර්ණය කිරීමෙන් තොරව සැපයුම්කරුගේ පිරිවිතරවලට අනුව ඇඟයීම් කර රු. 4,227,440 කට ජීව අපද්‍රව්‍ය දහනය කරන යන්ත්‍රයක් 2011 නොවැම්බර් 30 දින ඉතා හදිසි අවශ්‍යතාවයක් ලෙසට සලකා මිලදී ගෙන තිබුණද, මෙම යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 30 දින වන විටද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඕ) නිසි ඇගයීමකින් හා අවශ්‍යතාවයකින් තොරව, දන්ත වෛද්‍ය පීඨයේ දන්ත සකස් කිරීමේ දෙපාර්තමේන්තුව තොග ඇණවුම් කර තිබීම හේතුවෙන් රු.1,508,557 ක රසායන ද්‍රව්‍ය තොග අයිතම 21 ක් මාස 06 සිට වර්ෂ 08 දක්වා සහ රු. 597,861 ක් වටිනා පාරිභෝජන ද්‍රව්‍ය තොග අයිතම 10 ක් වර්ෂ 01 සිට 11 දක්වා කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

**3.5 ආර්ථිකමය නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ජල පොම්පාගාරය සඳහා වසර 30 කට පමණ පෙර මිලදී ගත් නමුත්, හොඳ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින විදුලි ට්‍රාන්ස්පෝමරයක් තිබියදී, 2010 වර්ෂයේදී රු. 1,552,910 ක් වැය කර විදුලි ට්‍රාන්ස්පෝමරයක් සවි කර තිබුණි.

(ආ) සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන්ට සායනික පුහුණුව ලබාදීම පිණිස පේරාදෙණිය, මහනුවර හෝ ගම්පොල ශික්ෂණ රෝහල් වෙත යොමු කිරීමට කටයුතු කිරීමෙන් තොරව, කුරුණෑගල මහරෝහල වෙත සිසුන් රැගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේදී පෞද්ගලික බස්රථ ගාස්තු වෙනුවෙන් රු. 528,192 ක්ද, රියදුරු සහායකයින් සහ වෙනත් නිලධාරීන් සඳහා ගමන් වියදම් වෙනුවෙන් රු.243,335 ක්ද වශයෙන් එකතුව රු.771,527 ක වියදමක් දරා තිබුණි.

(ඇ) ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති සේවා මුර කාලසටහන අනුව ආරක්ෂක නිලධාරියකු විසින් අවම වශයෙන් මාසයකට පැය 192 ක් සේවයේ යෙදිය යුතු වුවද, එලෙස මාසයකට අවම වශයෙන් සේවය කළයුතු කාලය සේවය නොකර තිබියදී සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී පමණක් එකතුව රු. 774,262 ක මුදලක් අතිකාල වශයෙන් ගෙවා තිබුණි.

(ඈ) සම සෞඛ්‍ය වෛද්‍ය පීඨය සඳහා කේ.වී.ඒ.400 විදුලි ට්‍රාන්ස්පෝමරයක් මිලදී ගැනීමට 2011 වර්ෂය අවසානයේදි රු. 4,143,413 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබියදී එම මුදලට මිලදී නොගෙන අදාල ට්‍රාන්පෝමරය මිලදී ගැනීම ප්‍රමාද කර පසුව රු. 6,008,676 කට ට්‍රාන්සපොමරයක් මිලදී ගැනීම හේතුවෙන් රු. 1,865,263 ක මුල්‍යමය අලාභයක් සිදුව තිබූ අතර, එය 2013 ජුලි මස වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

**3.6 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දන්ත වෛද්‍ය පීඨයේ දන්ත සකස් කිරීමේ දෙපාර්තමේන්තුවේ භාණ්ඩ තොග නියැදියක් සම්බන්ධව භෞතිකව කළ පරීක්ෂාවේදී රු.695,627 ක් වටිනා තොග කල්ඉකුත්ව තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ඉංජිනේරු පීඨයේ පීඨාධිපති කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂවලදී මිලදී ගෙන තිබූ රු. 373,719 ක භාණ්ඩ අයිතම 06 ක් අස්ථානගත වී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයීය සේවකයන් වෙනුවෙන් සේවා නියුක්ති භාරකාර අරමුදලට 2011 හා 2012 වර්ෂ සඳහා දායක මුදල් නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් රු.975,965 ක අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ සේවකයකු වෙනුවෙන් අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් නොගෙවීම මත රු. 40,182 ක අධිභාර මුදලක්ද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා දායක මුදල් නොගෙවීම මත රු. 224,008 ක අධිභාර මුදලක්ද ගෙවීමට සිදුව තිබූ අතර, ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 සිට 2012 වර්ෂය දක්වා පැවත එන ගිවිසුම්ගත වටිනාකම රු. 6,240,416 ක්වූ කර්මාන්ත 24 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සඳහා සම්මන්ත්‍රණ ශාලාවක් ඉදිකිරීම පිණිස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට 2009 වර්ෂයේදි අත්තිකාරම් වශයෙන් රු. 500,000 ක් ගෙවා තිබුණද, 2013 මාර්තු 31 දින වන විටත්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. ගෙවන ලද අත්තිකාරම් මුදල වසර 04ක් ප්‍රමාදව ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රධානය කරන ලද කොන්ත්‍රාත් 6 ක් වෙනුවෙන් සංචලන අත්තිකාරම් ලෙස රු. 12,250,740 ක මුදලක් ගෙවා තිබුණි. එම කොන්ත්‍රාත්වල ගිවිසුම්ගත මුදලින් සියයට 18 සිට සියයට 81 දක්වා ප්‍රමාණයක මුදලක් ගෙවීම් කර තිබුණත්, රු. 4,552,272 ක සංචලන අත්තිකාරම් ආපසු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**3.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවය සඳහා පුද්ගලික අංශයේ ආරක්ෂකයින් 116 ක් සහ විශ්වවිද්‍යාල ආරක්ෂක සේවයේ ආරක්ෂකයින් 71 ක් වශයෙන් එකතුව 187 ක ආරක්ෂක පරීක්ෂක හා නියාමකවරුන් සේවයේ යොදවා තිබුණද, අනුමත කාර්ය මණ්ඩලය 116 ක් පමණක් විය. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 71 දෙනෙකු සේවයේ යොදවා තිබියදී, 2010, 2011 සහ 2012 වර්ෂවලදී පිළිවෙලින් රු.8,664,805 ක්, රු. 9,918,343 ක් හා රු. 9,508,437 ක් වශයෙන් ආරක්ෂක සේවය සඳහා අතිකාල දීමනා ගෙවා තිබුණි.

(ආ) අතපසුවී ඒකරාශී වූ වැඩ සඳහා අතිකාල දීමනා අනුමත නොකළ යුතු වුවත්, නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවේ සඳහන් වැඩ කොටස් ඉටු කිරීම් වෙනුවෙන් රු.62,327,455 ක් අතිකාල ලෙස ගෙවා තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 2101 කින් සමන්විත වූ අතර, වැටුප් සඳහා රු. 52,200,000 ක මුදලක් වර්ෂය තුළ ප්‍රතිපාදන සලසා තිබුණු නමුත්, තථ්‍ය කාර්ය මණ්ඩලය 956 ක් වීමෙන් පුරප්පාඩු තනතුරු 1145 ක් පවතින බැවින් සමාලෝචිත වර්ෂයේදී එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමෙන් තොරව නිලධාරීන් අතිකාල සේවාවේ යෙදවීම හේතුවෙන් රු. 62,327,455 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අධ්‍යයන කාර්ය මණ්ඩයේ තනතුරු 64 කට අදාලව නිලධාරීන් 208 ක් පුරප්පාඩු පැවතුණි.

(ඉ) අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 746 දෙනෙකුට 2012 ජුලි සිට සැප්තැම්බර් මාසය දක්වා වූ කාලසීමාව තුළ වැඩ වර්ජනයේ යෙදීම හේතුවෙන් කිසිදු සේවයක් ලබා නොගෙන රු. 52,326,817 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඊ) අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ සේවයේ නියුතු නිලධාරීන් තිදෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.1,289,150 ක වැටුප් ගෙවා තිබුණි.

(උ) කෘෂිකර්ම පීඨයේ සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් නියමයන්ට අනුකූල නොවන ලෙස කථිකාචාර්යවරයෙකු බඳවා ගෙන ඔහු හට 2002 සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 6,658,935 ක් ගෙවා තිබුණි. මෙම කථිකාචාර්යවරයා වෙත ආචාර්ය උපාධිය හැදෑරීම වෙනුවෙන් 2003 පෙබරවාරි 05 දින සිට මාස 39 ක කාලපරිච්ඡේදය තුළදී විදේශ අධ්‍යයන නිවාඩු ලබා දී තිබුණි. 2013 පෙබරවාරි දක්වාම ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නොතිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව, අයකළයුතු රු. 2,057,165 ක ඇප බැඳුම්කරයේ වටිනාකම අයකර ගෙන නොතිබුණි.

(ඌ) ශාස්ත්‍ර පීඨය, දන්ත වෛද්‍ය පීඨය හා සම සෞඛ්‍ය වෛද්‍ය පීඨය සඳහා අනුමත කථිකාචාර්යවරුන්ගේ පුරප්පාඩු 50 ක් පැවතියදී එම පුරප්පාඩු පිරවීමකින් තොරව, බාහිර හා තාවකාලික කථිකාචාර්යවරුන් 172 දෙනෙකු බඳවාගෙන රු.11,672,209 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

සංයුක්ත සැලැස්මෙහි අයවැයගත ප්‍රාග්ධන වියදම් වාර්ෂික අයවැය සමඟ ඇතුළත් කළයුතු වුවද, අයවැය ලේඛණයේ ඇතුළත් රු.383,490,000 ක ප්‍රාග්ධන වියදම් සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

**4.2 ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංයුක්ත සැලැස්මට අනුකූලව ක්‍රියාකාරී සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරකම් 09 කට අදාලව එම අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 පාලක සභා රැස්වීම්**

සමාලෝචිත වර්ෂය තුළ පාලක සභා රැස්වීම් වාර 11 ක් පවත්වා තිබුණද, 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව, කාර්යක්ෂමතාවය අගය කිරීම හා මගපෙන්වීම සඳහා අදාළ වාර්තා හා තොරතුරු පාලක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**4.4 ප්‍රසම්පාදන සැලැස්ම**

දන්ත වෛද්‍ය පීඨය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 15,472,301 ක් හා ශාස්ත්‍ර පීඨය සඳහා රු.2,029,209 ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව, ඊට අදාලව ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි.

**4.5 අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයේ සඳහන් ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය වු හෙයින් අයවැය ලේඛණය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(i) වැය විෂයයන් 18 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවීම්වල එකතුව රු.182,082,191 ක්වු අතර, එහි ප්‍රතිශතය සියයට 30 සිට සියයට 437 ක පරාසයක් ගෙන තිබුණි.

(ii) වැය විෂයයන් 16 ක අධි ඇස්තමේන්තු කිරීම් රු.66,629,928 ක් වූ අතර, එහි ප්‍රතිශතය සියයට 21 සිට සියයට 99 ක් අතර පරාසයක පැවතුණි.

(iii) ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලට ඇතුළත් නොවූ වැය විෂයයන් 08 කට අදාළ එකතුව රු.3,673,360 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂය තුළදී දරා තිබුණු අතර, වැය විෂයයන් 04 ක් සඳහා සළසා දී තිබූ රු. 1,500,000 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(iv) ආදායම් විෂයයන් 07 කට අදාලව රු. 34,137,379 ක ආදායම් ලබාගෙන නොතිබුණි.

(ආ) කෙටුම්පත් අයවැය වාර්තාව සඳහා මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට ප්‍රථම පාලක සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අයවැය වාර්තාව සඳහා අනුමැතිය ලබා ගන්නා ලද්දේ 2012 ජුනි 09 වන දිනය.

5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ආදායම් රැස්කිරීම හා ගිණුම්ගත කිරීම

(ආ) අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීම

(ඇ) තොග පාලනය

(ඈ) වාහන පාලනය

(ඉ) පර්යේෂණ ප්‍රදාන උපයෝජනය

(ඊ) අරමුදල් උපයෝජනය

(උ) මානව සම්පත් කළමනාකරණය.

(ඌ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(එ) සේවක ණය පරිපාලනය

(ඒ) කොන්ත්‍රාත් පරිපාලනය